අලගියවන්න මුකවෙටි තුමා

ගණේගොඩ පුවත අනුව පියාගේ මරණයෙන් පසු රාජසිංහ රජු රජ මාලිගයට භික්ෂූන් කැඳවා මේ මරණය පිළිබඳ සාකච්ඡාවක් කොට ඇත. එතැනදී වෘධ භික්ෂූන් වහන්සේලා මුවෙන් නොබැන සිටියදී සාමනේර හිමි නමක් පියා මැරූ පව ගෙවන්නට බැරි ය'යි කීවේලූ. ඊට පසු රජු භික්ෂූන් ගැන කලකිරී ඇත. ජාතක කථාවේ රකුසා දහම් සොඬ රජුට බණ කියා ඇත්තේ "අනිච්චාවත සංබාරා" යන ගාථාවෙනි. එය මරණයකදී බණ කියන්නට සුදුසු ධර්ම ගාථාවකි. කෙසේ උනත් එදා භික්ෂූන්ගෙන් රජුගේ සැනසිල්ලට හේතුවන දහමක් ප්‍රකාශ වී නැත.

දහසය වැනි සියවස මුල දශකය දෙකතුනක් හැර ඉතිරි කාල පරිච්ඡේදයත් දහහත් වැනි සියවසේ වසර කිහිපයකුත් සීතාවක සාහිත්‍ය සමය හැටියට සැලකිය හැකිය. සිංහල සාහිත්‍යයේ ක්‍රමවත් පරිනත බවක් මේ සුළු කාලයක තුලදී දක්නට නැත. ඩබ්ලිව්. ඒ. සිල්වා සුනේත්‍රා නව කථාවෙන් අවිචාර සමයක් ලෙස හඳුන්වාදුන් මෙබඳු අවධියක උසස් කලා නිර්මාණයන් බිහිවිය නොහැකිය. පාලකයෝ බලය සඳහා උන් උන් අරගල කරගත්හ. අනුසාසකයෝද කල්ලි ගැසී කුමංතුණ කළහ. පෘතුගීසීන්ගේ කෘර පාලනය නිසා කෝට්ටේ රාජ්‍යයේත් සමුද්‍රාසන්න පෙදෙස්වලත් වැසියෝ හෙම්බත්ව සිටියහ. භුවනෙකබාහු ධර්මපාල වැන්නෝ පරංගීන් යටතේ රකඬ බව පත්වූහ. ඔවුන්ගේ නම්ගම් හා ආගම බදාගැනීමෙන් සිංහලයෝ දීනයන් බවට පත්වූහ. මායා දුන්නේටවත් රාජසිංහයන්ටවත් පෘතුගීසීන් පළවා හැර රටේ ඒකීය භාවය රැක ගැනීමේලා සාර්ථක ලෙස සටනට බැසීමට අපේම අය ඉඩ නොතැබූහ. භික්ෂූන් වහන්සේලා පළමුව වූ පරංගීගේ හිරිහැර වලින් ද පසුව රාජසිංහයන් නිසා ඇති වූ භීෂණයෙන් ද මිදීම අරමුණු කරගෙන සී සී කඩ විසිර ගියහ. පොත පත විනාශ වූ බවක් ද කියැවේ. ධර්ම ශාස්ත්‍රෝත්තනිය සඳහා වටපිටාව පැහැපත් නොවීය.

මෙබඳු පසුබිමක් යටතේ නිදහස් සංකල්පය පහළ නොවේ. නිවහල් චිත්තාවන් මතු නොවේ. එනිසාම උසස් සාහිත්‍යයක් ගොඩ නැගීමේ වරම නොලැබුණි. කතරක් මැද කෙම් බිමක් මෙන් සියනෑ කෝරළයේ හිස්සැල්ලේ ධර්ම ද්වීප (දහම් දප) පඬිතුමාගේ පුත් අලගියවන්න මුකවෙටි තුමා පහළ විය. හේ පියාගෙන් ශාස්ත්‍රෝද්ගහණය කළේය.

දහම් දප පඬිවරයාගේ පුතා අලගියවන්න වූයේ කෙසේද ? විමසිය යුතු කාරණයකි. අලගිය වන්න යන්න සිංහල වනයක් නොවිය හැකිය. එහි ද්‍රවිඩ ඌරුවක් පෙනේ. අලක + ඊස්වර අලකේස්වර විය. අලක + කෝනාර අලගක්කෝනාර විය. අලක + ඉන්ද්‍ර අලහෙන්ද්‍ර විය. අලක + කෝන් අලහකෝන් විය. එමෙන්ම අලක + අයියා අලගයියා විය හැක. එයම "අලගියා" විය හැකිය. වරක් අලගිය වන්නයන් වෙත අධිකරණ කටයුත්තක් සඳහා ආ මිනිසකුගෙන් නම විමසූවිට "අලගියා" යයි කී නිසා ඔහුට දඬුවම් පැමිණවූ බව ජන වහරේ එයි. වන්නයන්නට මුලින් අලගිය යන්න එක්වූයේ කෙසේද'යි විමසිය යුතුය.

මුකවෙටි යනු රජවාසල නිලයකි. කෝට්ටේ සයවන පැරකුම්බා රජුගේ රාජ සභාවේද වාසල මුක්වෙට්ටිවරු සිටි බව හංස සංදේශයේ ඇතුළත් වෙයි. මෙම තනතුර රජවාසල අධිකරණ සේවයට සම්බන්ධ වූ එකකි.

අලගිය වන්නයන්ගේ කෘති අතර සැවුල් සන්දේශයට විශේෂ තැනක් හිමි වේ. විශේෂයෙන් එදා සීතාවක පැවති තොරතුරු මෙහි පැහැදිලි වේ. එමෙන්ම සීතාවක රාජ්‍ය පිළිබඳ යම් යම් වැරදි තොරතුරු නිවැරදි කර ගැනීමටද සැවුල් හස්න උදව් වෙයි. මෙය ලියා ඇත්තේ රාජසිංහ රජතුමාත්, සම්බුද්ධ ශාසනයත්, යුධ හමුදාවත් ආරක්ෂා කරන ලෙස සබරගමුවේ සමන් දෙවියන්ට කරන ආයාචනයක් පරිදිදෙනි. සැවුල් සංදේශය ලියන විට රාජසිංහ රජතුමා වෙත බුදුසමය කෙරෙහි අහිතකර හැඟීමක් නොවුණු බව මේ කෘතියෙන් පෙනේ. මහින්දාලංකාර හිමියන්ගේ ආරක්ෂාව ඇතිව සීතාවක රාජ්‍යයටම අයත් දෙල්ගමු විහාරයේ දළදා වහන්සේ වැඩ සිටි බව සඳහන්වේ.

"බඹ සුර උරග කිරුළග මිණි රසි න
හැම වර පුදන සරිපා තඹරින් සොබ න
මුනි වර වදන ඹර සුලකන තරිඳු මෙ න
මම්තුර නමඳා දළදා හිමි හට බැති න"

මෙසේ දෙල්ගමු වෙහෙර වැඩ සිටි දළදා වහන්සේටවත් එහි මහින්දාලංකාර හිමියන්ටත් රජුගෙන් හිසාවක් වී නොමැත.

සීතාවක හෙරව කෝවිල පිළිබඳ සත්‍ය කරුණු එහි ඇතුළත්ය. එය සම්පූර්ණ ආයතනයක්ව පැවති බවත් ගොඩනැගිලි සම්පූර්ණව පැවති බවත් එහි වූ චිත්‍ර පිළිබඳවත් නරඟන විමන ගැනත් තොරතුරු එහි වෙයි. එමෙන්ම එදා සීතාවක නගරයේ මෙපුර වීදියේ අධිකරණ විසඳු මහ පාය, මගුල්වීදිය, විකුම් සිහ මැති කරවූ වසූවිල් විට මහ මඬම ඇත්හල, ගැටහැත්තේ කඩවත ආදී තොරතුරු ඉතා වැදගත් වේ. සීතාවක යුගයේ පැවතුණු සාසනික පරිහානිය දහම් සොඬ ද කවෙන් සංකේතවත් වෙයි. බණ පදයක් අසන්නට සුදුසු පුද්ගලයෙකු සොයා ගිය රජෙකුගේ චරිතය දහම් සොඬ කවෙන් නිරූපනය වෙයි. ධර්මය වෙනුවෙන් දහම් සොඬ රජු රකුසාට උවත් දිවි පුදන්නට සැරසෙයි. සීතාවක අවධියේ දහම් දැනුම තුබුණු අය විරල වූ බැවින් අලගිය වන්නයන්ට මේ ජාතක කථාව පදසයට නැගීමට සිතුනා විය හැකිය. බුවනෙකබාහු රජුගෙන් තනතුරු ලැබූ පාණඩුණු කෝරළය බද මාම්පය පියසේ විසූ විජයදප නම් පලිහ වඩන මැතිඳුගේ මුණුබුරු රාජසිංහ රජුගේ පා සෙවනේ වැඩුණු සමරදිවාකර මුකවෙටි මැතිඳුන්-ගේ ආරාධනාවෙන් පොත ලියැවිනි. දෙදෙනාම රජවාසල හොඳින් හැඳින ගත් අයයි. බුදු දහම අසන්නට පවා නොලැබුණු තත්කාලීන සමාජ තත්වය මේ ජාතකක කථා කාව්‍යයෙන් පැහැදිලි කරන්නට කතුවරයා සිතන්නට ඇත.

ගණේගොඩ පුවත අනුව පියාගේ මරණයෙන් පසු රාජසිංහ රජු රජ මාලිගයට භික්ෂූන් කැඳවා මේ මරණය පිළිබඳ සාකච්ඡාවක් කොට ඇත. එතැනදී වෘධ භික්ෂූන් වහන්සේලා මුවෙන් නොබැන සිටියදී සාමනේර හිමි නමක් පියා මැරූ පව ගෙවන්නට බැරි ය'යි කීවේලූ. ඊට පසු රජු භික්ෂූන් ගැන කලකිරී ඇත. ජාතක කථාවේ රකුසා දහම් සොඬ රජුට බණ කියා ඇත්තේ "අනිච්චාවත සංබාරා" යන ගාථාවෙනි. එය මරණයකදී බණ කියන්නට සුදුසු ධර්ම ගාථාවකි. කෙසේ උනත් එදා භික්ෂූන්ගෙන් රජුගේ සැනසිල්ලට හේතුවන දහමක් ප්‍රකාශ වී නැත.

"කමල නැති විල මෙන
තරල මිණ නැති හර මෙන
ගහණ සුන් වන මෙන
දහම් නැත් ලොව නොවේ සසො බන
සදහම් නොමැති කල
නොමදැනෙයි පින්පවු දෙකෙහි පල"

බුදු බණ පිළිබඳ අගය රජතුමාට වක්‍රාකාරයෙන් අඟවන්නට කවියා මෙම ජාතක කථාව තෝරාගෙන ඇති බව සිතිය හැකිය.

රජු සනසන්නට භික්ෂූන් ඉදිරිපත් නොවූ විට අරිට්ට කී වෙණ්ඩු රකුසාට වත් බිලිවන්නට රජු සිතා ගත්තා නොවිය හැකි ද ?

භුවනෙකබාහු රජුගේ මහ ඇමති සේපාල අධිකාරීන් ගේ මිනිඹිරිය වූද පළමුවැනි රාජසිංහ රජුගේ පා සෙවනෙහි වැඩුණු අත්ත නායක මැතිගේ භාර්යාව වූද මැණික් සාමි කුල කාන්තාවගේ ආරාධනාවෙන් කුස ජාතකය ලියැවිණි. අලගිය වන්නයෝ සත් රජුන්ගේ එසිමැඩි කුස රජුගේ සංග්‍රාමශීලී බව කුස ජාතකයෙන් පැහැදිලි කරයි. කුස රජුගේ වික්‍රමයත් රාජසිංහ රජුගේ තේජසත් සසඳා බැලීම මේ ග්‍රන්ථය ලිවීමේ එක් අරමුණක් විය හැකිය.

අලගියවන්නයන් ගේ සුභාෂිතය නීති උපදේශ කාව්‍යයකි. පද්‍ය සියයක් ඇති බැවින් ශතක පොතක් ද වේ. මෙහි එන හැම උප දේශයක්ව උචිත උපමාවකින් තීව්‍ර කර දක්වයි. රාජ්‍ය පාලනය පිළිබඳව උපදෙස් දෙන අතර පරසමය වාදී වීමේ ආදීනවද පෙන්වා දෙයි. අගතිගාමී ලෙස රාජ්‍යානුසාසනා කරන්නන් නිසා රාජසිංහ රජුට සෘජුව උපදෙස් දීමට යොමු නොවී වක්‍රාකාරයෙන් කෙරෙන අනුසාසනාවක් මෙන් පෙනේ.

විමසා බලමු මේ පද්‍යයන්

"රුවන් මිල නොදත් අනුවණ දන වෙළඳ
ලොඹින් කදා මැටි මිණියයි රැගත් ලෙඳ
පසන් මුණි වරන් හැර අන් සුරත් වැ ඳ
නිවන් පතා රැවටෙති සත ගෙන දුල ඳ

නඳන මුනිඳු හැර අන් සුරතට පැව ත
නිවන පතා අනුවණ් සත කරන තැ ත
ලබන පිණිස තෙල් ලොබ වඩවමිනි සි ත
මඩින වැන්න වැලි මලු ලමිනි තෙලි යත

සකල සුර නරන් මුදුනත සැදූ ප ඳ
විපුල මුණි සරණ හැර අන් සුරන් වැ ඳ
නිමල මොක් පිණිස සත රකිනා දුල ඳ
දිඹුල මල නිසා වෙහෙසෙනු වැනි දියැඳ"

බුදුන් අමතක කර දෙවියන් පිදූ හැමට කවියා පැහැදිලි කර දෙන යථාර්ථය මෙයයි.

"නිදොස් ගුණ බරණ සදහම් කිරුළ ද රා
වෙසෙස් සිල් සෙනග ගෙන මෙත් තුරඟ අරා
කෙලෙස් රපුන් සිඳ නැණ කඟිනි නොම හැරා
සතොස් රජ සරින් පැමිණෙව් නිවන් පුරා"

මුහුකුරා ගිය යුධ ශක්තියෙන් පිරිපුන් රාජසිංහ රජතුමා ට දෙන අවවාදයක් නොවෙයි ද?

"විපුල නැණැති මහතුන් හට පත් විප ත
නිසල නැණින් යුතු උතුමෝම දුර ල ත
කලල ගිලුණු මත වරණිඳු ගොඩ ගනු ත
තුමුල බලැ'ති ගිජඳකු මිස අන් කෙව ත"

කලල ගිලුණු මත වරණිඳු රාජසිංහයන් හැර අන් කවරෙක් ද?

නුවණැත්තවුන් පහකොට දුදනන් සෙවූ න
නොමිගත් සිත තුළෙහි ගුණ පොකුරඹලෙසින
මැදහත් නොව මසුරු ගුණයෙන් දවස රින
රජුටත් එරටටත් අතුරක් නැත වෙනි න

"කුලයෙන් හුණු දනන් මහතුන් සෙවුන් කොට
ඉසුරෙන් යුතුව පැමිණෙන් ගරු තනතු රට
වෙසෙසින් කුසුම් ගෙතුමෙන් සුමුසු රඹ පට
සතොසින් සැපත් වේ හිරිඳුන් මුදුන් තට"

අරිට්ට කී වෙන්ඩු වැන්නන්ට එල්ල කරන සියුම් උපහාසයක් වැන්න.

"තොවිතර තෙද බලැති උතුමන් හට පවර
වැර සැර මඳ නුවණ මඳ දන බඳිනු වෙර
තුතුතර ගිර පලන දළ දළගින් පැහැර
මතවර ණිඳුට පෙදෙ නැන වෙහෙසෙන අයුර

රාජසිංහ වැනි වීරෝධාර උතුමන්ට වෛර කිරීම මත් ඇතෙකුට පයින් ඇන වෙහෙසෙන්නාක් වැනිය. කවියා ව්‍යංගයෙන් කියන්නේ එබඳු අදහසකි.

"සපෙක් එකකු කෑ නම් නසිනේ හෙ වෙද
අනික් ලොවින් නොනසේමය සතෙකෙ කද
පසක් දුදන පඬු කණ මුවලං කෙළඳ
වගක් නසයි එමතුද වැනසේය හෙද"

දුදනා ප්‍රභූවරයාගේ කණට මුඩය ලං කළේ නම් ජාතියක්ම නැසෙනවා පමණක් නොව හේද වැනසෙයි. අරිට්ට කී වෙන්ඩු වැන්නන්ට ඉලක්ක කොට පවසන ලද්දක් වෙයි. විශේෂයෙන් තත්කාලීන ප්‍රභූ සමාජයේ දක්නට ලැබුණු දුබලකම් මැනවින් විග්‍රහ කරමින් අලගියවන්නයන් ලියන ලද සුභාෂිතය සර්වකාලීන වටිනාකමක් ඇති උපදේශ ග්‍රන්ථ රත්නයකි. මරුවා උපහාසයට ලක්කරමින් අලගියවන්නයන් මරණ මංචකයේදී කියන ලදැ'යි සැලකෙන මේ කවද ජනප්‍රවාදයේ ඇත.

"කාත් නැතෙයි නොසිතන්න මරුව මගේ පුර බලේ
මාත් මගේ වග දන්නෝ මා නො දමති කැලේ
මාත් ගතිමි නම් යම රජුගෙන් ඔය මරු නි ලේ
තාත් තගේ අඹුවත් නටවමි මම දොර පි ලේ"

සීතාවක රාජසිංහයන්ගේ මරණයෙන් පසු සීතාවක රාජ්‍යය බිඳ වැටුණි. පෘතුගීසීන්ගේ ප්‍රහාරයන් නිසා නගරයද විනාශ විය. රජුට හිතවත්ව විසූ අලගියවන්න වැනි සමරදිවාකර වැනි ප්‍රාඥයන්ට පිටුවහලක් නැති විය. එබැවින් ඔවුන්ට පෘතුගීසීන් යටතේ නිලතල ලබා ගැනීමට සිදුවිය. පෘතුගීසීන්ට යටත් ප්‍රදේශවල තෝම්බුව (ජන ලේඛන විශේෂයකි) පිළියෙල කිරීමේ කාර්යයේදී ඔවුහු මොහුගේ සේවය ලබා ගත්හ. මෙතල කුරුවිට රාළ (අන්තෝනි බරෙත්තු) පෘතුගීසීන්ට විරුද්ධව සිංහල ප්‍රදේශවල කැරලි ඇති කළේය. මේ කැරලි මැඩලීමට ගෝවේ සිට කොන්ස්තන්තීනු ද සා නොරොඤ්ඤෝ නම් සොල්දාදුවා පැමිණියේය. ඔහු කොළඹ සිට ක්‍රමයෙන් උඹව දක්වා කැරලි මඩිමින් සටන් කළ ආකාරය කවියට නගා අලගියවන්න "කොන්ස්තන්තීනු හටන" ලිවීය. ඒ කාලය වන විට ඔහුද කිතු සමය වැලඳගෙන "දොන් ජොරනිමෝ" නමින් බෞතිස්ම ලබා සිටියත් අවසාන කාලයේ නැවතත් බුදුසමය වැළඳගත් බව පෙනේ.

ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

LA TROBE TAXATION SERVICES
14 day Tax Refund
INDIVIDUAL RETURNS $70
(Concession Rates for Students)
BUSINESS TAX RETURNS
(BAS / IAS)
La Trobe Taxation Services
BUNDOORA
Registered Tax Agent and Accountant
Contact
Mala : 9470 8241 or 0401 000 421
email : latrobetax@yahoo.com.au